# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 2 දරන
# බලශක්ති සංරක්ෂණ අරමුදල
# පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 ජනවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය

මිළ : ශත 90 යි

තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1985 අංක 2 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින.]

එල්. ඩී.—ඕ. 29/83.

**"බලශක්ති සංරක්ෂණ අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලසීමත් එහි අරමුණු හා බලතල නිශ්චය කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීමත් පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 2 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## 1 වන කොටස

### බලශක්ති සංරක්ෂණ අරමුදල පිහිටුවීම

2. (1) මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන බලශක්ති සංරක්ෂණ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලබන්නේය. බලශක්ති සංරක්ෂණ අරමුදල පිහිටුවීම.

(2) එම අරමුදල, (1) වන උපවගන්තියෙන් ඊට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය; තවද එම නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි වන්නේ ය.

3. (1) මෙහි මින්මතු විධිවිධාන සලසනු ලබන පරිදි සංස්ථාපිත අධ්‍යක්ෂ මණ්ඩලයකට මෙම අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පැවරිය යුතු ය. අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය.

(2) අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය:—

(අ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්—

(i) බලය හා බලශක්තිය සංරක්ෂණය කිරීම හා සම්බන්ධ කාරණා පිළිබඳව කටයුතු කිරීමෙහි දී ඒවායේ පරිපාලනය, විද්‍යාත්මක, කාර්මික, ආර්ථික හා ක්‍රම සම්පාදක අංශවල පළපුරුද්දක් ඇති හා හැකියාවක් දක්වා තිබෙන බවට අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරෙන් එක් සාමාජිකයකු;

(ii) මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා මහා භාණ්ඩාගාරයෙන් එක් සාමාජිකයකු;

(iii) වන සංරක්ෂණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එක් සාමාජිකයකු;

2—ඒ 080726—6,750 (84/12)

(iv) අදාළ අමාත්‍යවරයා විමසා රාජ්‍ය අංශයෙහි විශාල වශයෙන් බලශක්තිය පාවිච්චි කරන්නන්ගේ නියෝජිතයකු බවට අමාත්‍යවරයාගේ මතය වන එක් සාමාජිකයකු; සහ

(ආ) නිල බලයෙන් පත් කෙරෙන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්—

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්;

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා; සහ

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා.

(3) අමාත්‍යවරයා විසින් සාමාජිකයන් අතුරෙන් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කළ යුතු ය.

(4) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යාවෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, ඒ සඳහා හේතු කිසිවක් නොදක්වා ඔහු විසින් එසේ කළ හැකි ය.

(5) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා අමතා ලද ලිපියක් මගින් කවර වූ හෝ අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) මණ්ඩලයේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් ස්වකීය රැස්වීම් සහ එම රැස්වීම්වල කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් වූ කාර්ය පරිපාටිය විධිමත් කළ හැකි ය.

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් ඇතිවීම හෝ එහි සාමාජිකයකුගේ පත්වීම සම්බන්ධයෙන් වූ යම් අක්‍රමිකතාවක් පමණක් හේතුකොට ගෙන එහි කිසිම ක්‍රියාවක් හෝ කාර්යයක්, නිෂ්බල නොවිය යුතු ය.

(9) අසනීපවීම හෝ ශ්‍රී ලංකාවෙහි නොසිටීම හෝ වෙනත් යම් කරුණක් හේතුකොට ගෙන මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින් ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අසමත් වුවහොත්, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(10) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ධුරය අතහැර ගියහොත් මිස, මණ්ඩලයේ සෑම සාමාජිකයකුම අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. කාලය ඉක්ම යාම මගින් ධුරය අතහැර යන මණ්ඩලයේ යම් සාමාජිකයකු යළි පත් කරනු ලැබීම සඳහා හිමිකම් ලැබිය යුතු වන්නේ ය.

(11) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ස්වකීය ධූර කාලය ඉකුත්වීමට කලින් ස්වකීය ධූරය අතහැර යනු ලබන්නේ නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයා ස්වකීය ධූරය කලින් අතහැර යන්නේ නම් මිස, එම අනුප්‍රාප්තිකයා විසින්, තමා අනුප්‍රාප්ත වන තැනැත්තාගේ ධූර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

4. (1) මණ්ඩලයේ සභාපතිවරයා විසින්, පැමිණ සිටින්නේ නම්, මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයා එවැනි යම් රැස්වීමකට පැමිණ නොසිටියහොත්, පැමිණ සිටින සාමාජිකයන් විසින්, එවැනි රැස්වීමක මූලාසනය දැරීම සඳහා, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් එක් අයකු තෝරා පත් කර ගත යුතු ය. මණ්ඩලයේ සභාපතිවරයා.

(2) අසනීපවීම හෝ ශ්‍රී ලංකාවේ නොසිටීම හේතුකොට ගෙන සභාපතිවරයා විසින්, ස්වකීය ධූරයෙහි කාර්ය ඉටු කිරීම තාවකාලිකව නොහැකි වුවහොත්, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් ඒ සඳහා කිසිම හේතුවක් නොදක්වාම, සභාපතිවරයාගේ පත්වීම අවසන් කළ හැකි ය.

(4) සභාපතිවරයා විසින්, අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින්, කවර වූ හෝ අවස්ථාවක සභාපති ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය. එවැනි ඉල්ලා අස්වීමක් අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබීමෙන්, එය ක්‍රියාත්මක විය යුතු ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, තම මණ්ඩලයේ සාමාජික ධූරය දරන තාක් කල් සභාපතිවරයා විසින් මෙම ධූරය දැරිය යුතුය.

5. අරමුදලේ මුද්‍රාව— අරමුදලේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් තැනැත්තන් භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කළ හැකි ය; තවද

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව සහ තමා පැමිණ සිටීමේ සාක්ෂි වශයෙන් යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් අත්සන් කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, එම සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තැබිය නොයුතු ය.

## 2 වන කොටස

## අරමුණු සහ බලතල

6. ශ්‍රී ලංකාවේ බලශක්ති ඉල්ලුම, කළමනාකරණය හා සංරක්ෂණය පිළිබඳ වැඩසටහන්වල යම් හෝ සියලු අංග හා සම්බන්ධ කර්තව්‍යයන් හා ව්‍යාපෘතීන් සඳහා මුදල් යෙදවීම, ඒවා ප්‍රවර්ධනය කිරීම සහ මූලාරම්භ කිරීම සහ විශේෂයෙන්ම— අරමුදලේ අරමුණු.

(අ) (i) කෘෂිකාර්මික, කර්මාන්ත, වාණිජ, ගෘහස්ථ හා ප්‍රවාහන අංශයන්හි බලශක්තිය පාවිච්චි කිරීමෙහි ලා; සහ

(ii) බලශක්තිය, පිරිසැකසුම, පරිවර්තනය, ප්‍රවාහනය, රැස් කිරීම, සමබලෝත්පාදනය හා තාපය ලබාගැනීම පිළිබඳ ශිල්පීය ක්‍රම නිපදවීමෙහිලා—

කාර්යක්ෂමතා දියුණු කිරීම සම්බන්ධයෙන් ලබාගත හැකි තාක්ෂණික ක්‍රම හඳුනා ගැනීම;

(ආ) (i) මිල නියම කිරීම, ප්‍රතිපත්තිය සහ බදු අය කිරීම ඇතුළු ආර්ථික දිරි ගැන්වීම් සහ පසු බැස්සවීම්;

(ii) අධ්‍යාපනික හා ප්‍රවෘත්ති සේවා; සහ

(iii) ආයතන පිළිබඳ විධිවිධාන සහ වෙනත් යම් ක්‍රියා මාර්ග

වැනි, බලාත්මක කළ හැකි ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග හඳුනා ගැනීම;

(ඇ) ජාතික අවශ්‍යතාවන්ට අදාළ කාර්ය මූල බලශක්ති සංරක්ෂණ වැඩ සටහන් ක්‍රමවත් කිරීම හා වර්ධනය කිරීම කරනු ලබන කළමනාකාර මට්ටමේ ක්‍රියාශීලී සේවක පර්ෂදයක් ඇති කිරීම;

(ඈ) බලශක්තිය පිළිබඳ කාර්යක්ෂමතාව, ඉල්ලුම කළමනාකරණය හා සංරක්ෂණය පිළිබඳ වූ වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම සහ යම් ආයතනයක් විසින් මූලාරම්භ කරනු ලබන බලශක්ති සංරක්ෂණ වැඩ සටහන් වර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා අරමුදල් සැපයීම;

(ඉ) බලශක්තිය පිළිබඳ කාර්යක්ෂමතාව, ඉල්ලුම කළමනාකරණය හෝ සංරක්ෂණය සම්බන්ධයෙන් වූ වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙහිම ආයතනවලට සහායවීම;

(ඊ) බලශක්තිය පිළිබඳ කාර්යක්ෂමතාව, ඉල්ලුම කළමනාකරණය හෝ සංරක්ෂණය පිළිබඳ යම් අංශ සම්බන්ධයෙන් වූ පර්යේෂණ, සමීක්ෂණ හා පරීක්ෂණ මූලාරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම;

(උ) බලශක්තිය පිළිබඳ කාර්යක්ෂමතාව, ඉල්ලුම කළමනාකරණය හෝ සංරක්ෂණය සම්බන්ධයෙන් සමුළු, කම්හල් හා පාඨමාලා සංවිධානය කිරීම සහ බලශක්තිය පිළිබඳ ඉල්ලුම කළමනාකරණය හෝ සංරක්ෂණය සම්බන්ධයෙන් ජනතාවට ප්‍රවෘත්ති සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම;

(ඌ) බලශක්තිය පිළිබඳ ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාම සඳහා සම්මතයන්, මිමි, පිළිවෙත් හා වෙනත් මිණුම් දඬු නිශ්චය කිරීම සහ බලශක්ති සංරක්ෂණ ශිල්පීය ක්‍රම මගින් අපතේ යාම අඩු කිරීම;

(එ) විශේෂයෙන් අලුත් හා අලුත් කළ හැකි බලශක්ති මූලාශ්‍රවලින් යන්ත්‍ර බලශක්තිය ආදේශ කිරීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම සහ ඒවා වර්ධනය කිරීම සහ එම යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට තුඩු දෙන නියමු අධ්‍යයනයක් පවත්වාගෙනයාම;

(ඒ) බලශක්ති කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ සියලුම අංශයන්හි දීර්ඝ කාලීන ක්‍රම සම්පාදනය කිරීම හා ප්‍රතිපත්ති විග්‍රහ කිරීම, ප්‍රවර්ධනය කිරීම, ධෛර්යමත් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පවත්වාගෙන යාම;

(ඔ) බලශක්ති ඉල්ලුම කළමනාකරණය හෝ සංරක්ෂණය පිළිබඳ කවර වූ හෝ අංශයක් සම්බන්ධයෙන් වාර්තා, ලිපි, වාර සඟරා, ප්‍රවෘත්ති පත්‍ර, අතිරේකයන් හා කුඩා පොත් පළ කිරීම සහ ඒ සම්බන්ධයෙන් ප්‍රවෘත්ති හා අධ්‍යාපනයක් ලබාදීම;

(ඕ) බලශක්ති ඉල්ලුම, කළමනාකරණය හෝ සංරක්ෂණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ආයතන මගින් සංවිධානය කරනු ලබන සමුළුවලට හා කම්හල්වලට සහභාගිවීම සඳහා ද, අතිරේක ශිෂ්‍යත්ව හැදෑරීම සඳහා ද අරමුදල් සැපයීම; සහ

(ක) මෙම වගන්තියේ ඉහතින් වූ ඡේදවල දක්වා ඇති අරමුණු සාක්ෂාත්කර ගැනීම පිණිස ඉවහල් වීමට අවශ්‍ය විය හැකි පරිදි අමාත්‍යවරයා විසින් මෙම අරමුදල වෙත යොමු කරවනු ලැබිය හැකි වෙනත් යම් කරුණු

මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු විය යුතු වන්නේය.

7. (1) මෙම පනතේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, මෙම අරමුදලේ නාමයෙන්, මෙම අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ඉවහල් වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලුම ක්‍රියා මණ්ඩලය විසින් ඉටු කිරීමට බලය ඇත්තේ ය. මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍යයන්.

(2) (1) වන උපවගන්තියෙන් පිරිනමන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍යයන් ඉටු කිරීම කළ හැකි ය:—

(අ) දේශීය හෝ විදේශීය මාර්ගවලින් හෝ වේවා, අරමුදල් ලබා ගැනීම හෝ මුදලින් හෝ ද්‍රව්‍යයන්, ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාගයන් භාර ගැනීම;

(ආ) ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පවත්වාගෙන යාම සහ තෑගි පිරිනැමීම;

(ඇ) තරඟ පැවැත්වීම හා එවැනි යම් තරඟයකට සහභාගී වන කවර වූ හෝ තැනැත්තකු වෙත තෑගි, සහතික සහ වෙනත් පිළිගැනීමේ පත්‍රිකා පිරිනැමීම;

(ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍යයන් සහ කාර්ය ඉටු කිරීම සඳහා ද, අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද අවශ්‍ය විය හැකි සියලුම කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට, කෙලින්ම හෝ මණ්ඩලය විසින්

නත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නිලධරයන් හා සේවකයන් හෝ අනුයෝජිතයන් මාර්ගයෙන් ඇතුළුවීම හෝ සපුරා ලීම;

(ඉ) මෙම අරමුදලට අයත් අරමුදල් යම් ආයෝජනයන්හි ආයෝජනය කිරීම සහ එම ආයෝජන යළි කැඳවීම, යළි ආයෝජනය කිරීම හා වෙනස් කිරීම සහ එවැනි ආයෝජන මගින් එකතු වන ආදා යම එකතු කිරීම;

(ඊ) මෙම අරමුදලින් ලැබෙන මූල්‍යමය හෝ වෙනත් යම් ආධාරයක් සහ මෙම අරමුදල මගින් ප්‍රදානය කෙරෙන යම් මූල්‍යමය හෝ වෙනත් ආධාරයක් නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරනු පිණිස පැනවිය යුතු කොන්දේසි පිළිබඳ මූල්‍යමය පාලනය හා ඊට සම්බන්ධ වූ ගිණුම් කාර්ය පරිපාටිය ඇතුළුව මෙම අරමුදල පිළිබඳව කටයුතු කිරීම හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම;

(උ) මෙම අරමුදලේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා පිළිබඳ නියම හා කොන්දේසි නිශ්චය කරමින් රීති සෑදීම;

(ඌ) මෙම අරමුදලේ නිලධරයන් සහ සේවකයන් සම්බන්ධයෙන් විනයානුකූල පාලනයක් ක්‍රියාත්මක කිරීම; සහ

(එ) මෙම අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වේ යයි හෝ ඉවහල් වනු ඇතැයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාවන් කිරීම.

ආණ්ඩුව මගින් කෙරෙන ප්‍රදාන.

8. (1) මෙම පනත ක්‍රියාත්මක වීමේ දී ආණ්ඩුව විසින් රුපියල් මිලියන පහක මූලික ප්‍රදානයක් මෙම අරමුදලට ප්‍රදානය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මූලික ප්‍රදානයට අතිරේකව, ආණ්ඩුව විසින්, මෙම අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් කලින් කල මෙම අරමුදලට ප්‍රදානය කළ හැකි ය.

අරමුදලට කරනු ලබන ගෙවීම්.

9. (අ) 7 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ලබාගත් යම් අරමුදල් හෝ ලැබුණු ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාග හෝ ඉපයූ හෝ එකතු කළ මුදල්;

(ආ) 8 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබුණු යම් ප්‍රදානයන්; සහ

(ඇ) ආයෝජනවලින් හෝ මෙම අරමුදලට ලැබිය යුතු ලැබීම්වලින් ලත් යම් ආදායමක්;

මෙම අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්.

10. (අ) මෙම අරමුදල සම්බන්ධයෙන් කටයුතු කිරීම, එය පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වියදම්;

(ආ) නිලධරයන්, සේවකයන් සහ අනික් සේවා නියුක්තයන් වෙත වැටුප් ගෙවීම; සහ

(ඇ) මෙම අරමුදලේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ සහ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ එවැනි වෙනත් සියලු ගෙවීම්

මෙම අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

**11.** (1) මෙම අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

මුදල් වර්ෂය සහ අරමුදලේ ගිණුම් විගණනය කිරීම.

(2) මෙම අරමුදලේ ආදායම හා වියදම සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාම මණ්ඩලය විසින් සැලසිය යුතු ය.

(3) විගණකාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර සෑම වර්ෂයකම මෙම අරමුදලේ ගිණුම් විගණනය කළ යුතු ය.

**12.** (1) මෙම අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම හා කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් මණ්ඩලය විසින් පත් කළ හැකි අතර, එසේ පත් කරනු ලැබ යම් නිලධරයන් සහ සේවකයන් වෙත ගෙවිය හැකි පාරිශ්‍රමිකය තීරණය කළ යුතු ය.

අරමුදල පරිපාලනය කිරීම සඳහා නිලධරයන් පත් කිරීම.

(2) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින්, ඒ හා සමාන කැමැත්තක් ඇතිව, තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා අරමුදලේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබීම හෝ ඒ හා සමාන කැමැත්තක් ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීම හෝ කළ හැකි ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු මෙම අරමුදලේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 10 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු වෙත හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු මෙම අරමුදලේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 10 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු වෙත හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(5) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අරමුදලට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මෙම පනත යටතේ නඩු පැවරීමෙන් මණ්ඩලයේ සාමාජිකයන් සහ මෙම අරමුදලේ නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

**13.** (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ මෙම පනතේ කාර්ය සඳහා පත් කරනු ලැබූ අරමුදලේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මෙම පනත යටතේ හෝ මණ්ඩලයේ නියමය මත සද්භාවයෙන් යුක්තව කරනු ලබන හෝ ලද බව අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම තැනැත්තාට විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ මෙම අරමුදල මගින් හෝ ඊට විරුද්ධව පවරනු ලබන යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් මෙම අරමුදල විසින් කරනු ලැබූ යම් වියදමක්, මෙම අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් මෙම අරමුදල වෙත ගෙවන ලද හෝ ඒ මගින් අයකර ගනු ලැබූ යම් නඩු ගාස්තුවක් මෙම අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මෙම පනත යටතේ හෝ මණ්ඩලයේ නියමය මත කරනු ලබන හෝ කරනු ලබන්නේ යයි අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලබූ යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් දරණු ලැබූ යම් වියදමක්, එම ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යුක්තව බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, එම වියදම් සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගෙන ඇත්තේ නම් මිස, මෙම අරමුදලින් ගෙවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**14.** මෙම අරමුදලට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ මෙම අරමුදලේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

**15.** මෙම අරමුදලෙහි සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

**16.** අල්ලස් පනතේ අර්ථානුකූලව මෙම අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.